www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලාංකික තරුන ගෘහ සේවිකාව සෞදි අරාබියේ දී මරන දන්ඩනයට ලක් කෙරෙයි

## Young Sri Lankan maid faces execution in Saudi Arabia

**විලානි පීරිස් විසිනි**
**2007 ජුලි 13**

ජූනි 19 වෙනි දා සෞදි අරාබියේ දවාදමී ශ්‍රේෂ්ඨාධිකරනයේ දී ත්‍රි පුද්ගල විනිසුරු මඩුල්ලක් විසින් රිෂානා නෆීක් නමැති 19 හැවිරිදි ශ්‍රී ලාංකික කාන්තා කම්කරුවෙකුට මරන දඬුවම නියම කලේ ය. නෆීක්ගේ නඩුව දසදහස් ගනන් සංක්‍රමනික කම්කරුවන් මුහුන දෙන ම්ලේච්ඡ කොන්දේසි සහ ශ්‍රී ලංකා ආන්ඩුව ඔවුන් කෙරෙහි දක්වන අනුකම්පා විරහිත නොතැකීම පිලිබඳව තවත් උදාහරනයකි.

නෆීක් ට දඬුවම් පමුනුවනු ලැබුවේ, ඇය බාරයේ සිටි සිව්මස් වියැති බිලිඳෙකු මරනයට පත් කිරීම සම්බන්ධව ය. ගෘහ සේවිකාවක ලෙස සේවය කිරීම සඳහා 2005 මැයි මාසයේ දී රියාද් නගරයට පැමිනි ඇය ඇගේ හාම්පුතා වන නායිෆ් ජීෂියාන් බලාෆ්අල් ඔටයිබි විසින් දවාදමී හි ඔහුගේ නිවසට යවනු ලැබී ය. එහි ගොස් ටික දිනකට පසුව ලමුන් රැක බලා ගැනීම ගැන පලපුරුද්දක් හෝ පුහුනුවක් නොතිබූ ඇයට පවුලේ ළදරුවා බලා ගැනීම පැවරී ය.

2005 මැයි 22 ඇය තනිව ම ළදරුවාට කිරි පොවමින් සිටියා ය. දහවල් 12.30ට පමන ළමයාගේ හුස්ම හිරවීමට පටන් ගත්තේ ය. කලබලයට පත් වූ නෆීක් ඔහුගේ පපුවට, බෙල්ලට සහ මුහුනට තට්ටු කරමින් ළමයාව සුව කර ගැනීමට උත්සාහ කල අතර උපකාර ඉල්ලා කෑගැසී ය. මව පැමිනෙන විට ළමයා සිහි මූර්ඡාවී හෝ මිය ගොස් සිටියේ ය.

සිදුවූයේ කුමක් දැයි කරුනු සොයා බැලීමකින් තොරව, ළදරුවාගේ ගෙල මිරිකීම ගැන චෝදනා කරමින් ඔටායිබි පවුල නෆීක් දවාදමී පොලීසියට බාර දුන්නේ ය.

විදේශ කම්කරුවන් පිලිබඳව ක්‍රියා කරන සුපුරුදු ආකාරයට, හාම්පුතාගේ පැත්ත ගත් සෞදි පොලීසිය සිදු වූයේ කුමක් දැයි පැහැදිලි කිරීමට නෆීක්ට පරිවර්තකයකු ලබා නුදුන්නේ ය. ළමයාගේ ගෙල මිරිකීමේ චෝදනාව ඇයට එල්ල වූ අතර පාපෝච්චාරනයකට අත්සන් කිරීමට බල කෙරුනි. උසාවියේ ආරම්භක නඩු විභාගයේ දී පොලිස් තර්ජනය යටතේ ඇය ඒ හා සමාන පාපෝච්චාරනයක් කලා ය.

නෆීක්ට කතාන්තරයේ ඇගේ පැත්ත සම්බන්ධව විස්තර කිරීමට හැකිවුනේ රියාද්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ පරිවර්තකයකුගේ උපකාරය ලැබීමෙන් පසුව පමනි. පොලිස් තර්ජනය යටතේ ඇය සිටි බව ප්‍රකාශ කරමින් පෙබරවාරි 3 පැවති නඩු විභාගයේ දී ඇගේ පාපොච්චාරනය ඉල්ලා අස් කර ගත්තා ය. පොලීසියේ බිය ගැන්වීම පිලිබඳ චෝදනා නොතකා හැරි දවාදමී උසාවිය ඇය වැරදිකරු කොට හිසගසා මරා දැමීමට නියම කලා ය.

අභියාචනයක් ඉදිරිපත් කිරීමට ජූලි 16 දක්වා නෆීක්ට ඉඩ ඇතත් නීතිමය ගාස්තු ඇයගේ පවුලේ අයට දරා ගත නොහැකිය. නඩුවට පෙනීසිටීම සඳහා ශ්‍රී ලංකාවේ වැඩ කරන ජනයාට කිසිසේත් දරා ගැනීමට නොහැකි තරම් දැවැන්ත මුදලක් වන සෞදි රියාල් 250,000 (ඇ.ඩො. 67,000) සෞදි නීති ආයතනයක් ඉල්ලා සිටියි.

නීතිමය ගාස්තු ගෙවන ලෙස නෆීක්ගේ පියා ශ්‍රී ලංකා ආන්ඩුවට ආයාචනය කර ඇතත් එය මේ දක්වා ප්‍රතික්ෂේප කර ඇත. ආන්ඩුවේ ඩේලි නිව්ස් පත්‍රයට අනුව "නීති ආයතනයෙන් ඉල්ලා ඇති ගාස්තුව අඩු කර ගැනීම" සඳහා රියාද්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සාකච්ඡා කරමින් සිටියි.

නෆීක්ට එරෙහි චෝදනාව ඉතාම බරපතල නිසා අභියාචනය කිරීම අනවශ්‍යයැයි ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නියෝජ්‍ය කලමනාකරු එල්.කේ. රුහුනගේ ලක්බිම පත්‍රයට පැවසුවේ ය. ලෝක සමාජවාදී වෙබ් අඩවිය විදේශ සේවා නියුක්ති කාර්යාංශය ඇමතූ විට රුහුනගේ සම්බන්ධ කර ගැනීමට නොහැකි වූ නමුත් නම සඳහන් කිරීමට අකමැති වූ වෙනත් නිලධාරියකු රුහුනගේ ගේ ප්‍රකාශය ආරක්ෂා කරමින් "ගැහැනු ළමයා නිදහස් කර දීමට නීති ආයතනය සම්පූර්නයෙන් ම එකඟ වී නැති හෙයින් එපමන විශාල ගනනක් වියදම් කිරීම එලක් නැතැයි" ප්‍රකාශ කලේ ය.

ආරම්භයේ සිට ම, ශ්‍රී ලංකා ආන්ඩුව නෆීක් ඇගේ ඉරනමට අත හැර දමා තිබුනි. ඔවුන් නඩුව ගැන දැනගෙන සිටි බවත්, දවාදමී හි සෞදි බලධාරීන්ට කතා කල බව සහ නඩු විභාගයට පෙනී සිටි බව තානාපති නිලධාරින් විසින් තහවුරු කර ඇතත් නෆීක්ට

සහයෝගය ලබා දී නැත. දේශීය සහ ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධාන විසින් ශ්‍රී ලංකා ආන්ඩුව විවේචනය කල විට ජූලි 9 ඩේලි නිව්ස් පත්‍රය තානාපති කාර්යාලයේ සමාවට හේතුව වාර්තා කලා ය.: අභියාචනයක් ගොනු කිරීම සඳහා අදාල ලිපි ලේඛන ලබා ගැනීමට එයට හැකි වී නැත.

යථාර්ථය නම් මැද පෙරදිගට ලාබ ශ්‍රමය සැපයීමේ ලාබදායක වෙලඳමට බාධා විය හැකි කිසිවක් කිරීමට ශ්‍රී ලංකා ආන්ඩුව අකමැති ය. නෆීක් ආරක්ෂා කිරීම ආන්ඩුව විසින් ප්‍රතික්ෂේප කිරීම සරලව ම දසදහස් ගනන් කොන්ත්‍රාත් කම්කරුවන් තුච්ඡ ලෙස සූරාකෑම වැලැක්වීමට අසමත් වීම සම්බන්ධව සුවිශේෂ පැහැදිලි උදාහරනයකි.

තෙල්වලින් පොහොසත් සෞදි අරාබියේ 24 මිලියනයක ජනගහනයෙන් බහුතරය කුලී ශ්‍රමිකයන් ලෙස සේවයේ යොදවා ඇති ආසියාතිකයන් බහුතරයක් සහිත විදේශිකයෝ ය. සෞදි නීතිය යටතේ ඔවුන්ට ඇති අයිතිවාසිකම් සීමිත හෙයින් කොන්ත්‍රාත්තුව අහෝසි කෙරෙයි. බියෙන් ජීවත් වන ඔවුන්ට නිරන්තරයෙන් ම අඩන්තේට්ටම් කිරීම හෝ වැටුප් නොගෙවයි. විශේෂයෙන් ම තරුන කාන්තාවන් ගෘහ සේවිකාවන් ලෙස සේවයේ යොදවන අතර ඔවුන්ට සලකන ආකාරය වහලුන්ට වඩා වෙනස් වන්නේ සුලු වසයෙනි.

නෆීක් පැහැදිලි උදාහරනයකි. නැගෙනහිර මුතූර් නගරයේ මුස්ලිම් තරුනියක් වූ ඇය දුෂ්කර පරිසරයෙන් මිදී රැකියාවක් සොයා ගැනීමට අතිශයින්ම මංමුලාසහගතව සිටියා ය. උසාවියේ දී හෙලිදරව් වූ ආකාරයට ඇය සෞදි අරාබියට පැමිනෙන විට ඇගේ වයස යන්තම් අවුරුදු 17කි. රැකියා නියෝජිතයා ඇයගේ ලිපි ලේඛන වෙනස් කර වසර හයක් වැඩියෙන් පෙන්නුම් කෙරෙන විදේශ ගමන් බලපත්‍රයක් ලබා ගත්තේ ය. සෞදි අරාබියට ගිය පසු ඇයගේ හාම්පුතා කියන කියන දේ කිරීමට පැය 24 පුරාම බැඳී සිටියා ය. පිරිසිදු කිරීම, රෙදි සේදීම, මැදීම, ආහාර පිසීම ඇතුලු වැඩ කන්දරාවකට අමතරව ලදරුවා රැක බලාගැනීම ත් ඇයට පැවරී තිබුනි.

පවුලේ සාමාජිකාවක් වූ ෆරීනා නාසික් බීබීසී ප්‍රවෘත්ති සේවයට ප්‍රකාශ කලේ: "ඇයට දරුවන් දසදෙනෙකු රැක බලා ගැනීමට සිදුව ඇතැයි කියා. ඇය ගොස් දින 20කට පසුව අපට ලිපියක් ලැබුනා. ... ඇය සතුටින් නොසිටි අතර ඇයට ඇගේ හාම්පුතා වෙනස් කිරීමට අවශ්‍යව තිබුනි." අලුයම තුනට අවදිවන ඇය. බොහෝ රෑ වන තුරු වැඩ කලා ය. ඇගෙන් ලැබුන එක ම ලිපිය එයයි.

නෆීක්ගේ නිර්දෝශී භාවය ෆරීනා අවධාරනය කලා ය: "අපිට මෙය විශ්වාස කරන්න බැහැ. අපට මුදල් නැති නිසයි අප ඇයව වැඩට යැව්වේ. ඇය අපරාධකාරියක් නෙමෙයි. ඇය නිර්දෝශියි.

මුතූර් පදිංචිකරුවෙකු වූ තස්ලිම් මොහොමඩ් නිෂ්බර් බීබීසීයට ප්‍රකාශ කලේ : "මේ ප්‍රශ්න ගැන ඇහැ පියාගෙන සිටීම ආන්ඩුව නතර කල යුතු යි. මේ සෝලිය නතර කිරීම සඳහා ඔවුන් පියවර ගත යුතු යි. "

ජාත්‍යන්තර ක්ෂමා ආයතනයට අනුව මේ වසරේ මුල් හය මාසය තුල කාන්තාවන් තිදෙනෙකු ඇතුලු සිය දෙනෙකු සෞදි අරාබිය තුල මරනයට පත් කර ඇත. එයින් භාගයක්ම වැඩි වශයෙන් පාකිස්ථානය, ශ්‍රී ලංකාව, ඇෆ්ඝනිස්ථානය, ඉරාකය වැනි දුප්පත් රටවලින් පැමිනි විදේශිකයෝ ය.

පසුගිය පෙබරවාරි මාසයේ දී ශ්‍රී ලාංකිකයන් හතර දෙනෙකු - වික්ටර් කොරයා, රන්ජිත් ද සිල්වා, සන්තෝෂ් කුමාර් සහ ශර්මිලා සන්ගීත් කුමාර් - මංකොල්ලකෑම සහ ආයුධ ලඟ තබා ගැනීමේ වරදට හිස ගසා දැමුවේ ය. සෙසු විදේශික කම්කරුවන් බියගැන්වීමේ අශික්ෂිත උත්සාහයක් ලෙස සෞදි බලධාරීහු මලමිනී මහජන ප්‍රදර්ශනයට තැබූහ.

හතරවන චූදිතයා වසර 15ක සිර දඬුවමකට යටත් කර ඇතැයි යන විශ්වාසය ඇතිව, අනෙක් තිදෙනාගේ මරන දඬුවමට එරෙහිව ජාත්‍යන්තර ක්ෂමා ආයතනය යලි යලිත් ආයාචනා කලේ ය. ඔවුන්ව නිදහස් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා ආන්ඩුව කිසිම දෙයක් කලේ නැත. සෞදි අරාබි නීතිය උල්ලංඝනය නො කිරීම වැදගත් යයි මාධ්‍යවලට ප්‍රකාශ කරමින් ශ්‍රී ලංකා සුබසාධන ඇමති කෙහෙලිය රඹුක්වැල්ල මරන දඬුවම ආරක්ෂා කලේ ය.

විදේශීය කොන්ත්‍රාත් කම්කරුවන්ට සලකන ආකාරය කෙරෙහි ශ්‍රී ලංකාව තුල කෝපය වර්ධනය වන තතු තුල නියෝජ්‍ය විදේශ ඇමති හුසේන් බහායිලා සහ නීති උපදේශකයකු සමග නෆීක්ගේ දෙමව්පියන් සෞදි අරාබියට යැවීමට ආන්ඩුව අන්තිම මොහොතේ දී තීන්දු කලා ය. සංචාරයේ අරමුන නෆීක් ආරක්ෂා කිරීමේ නීතිමය පියවර ගැනීම නොව, අනුකම්පා ඉල්ලා සෞදි බලධාරින්ට මල ලමයාගේ පවුල පුද්ගලිකව ආයාචනය කිරීම ය. ආන්ඩුවේ ප්‍රකාශක රඹුක්වැල්ල ඒසියන් ට්‍රිබියුන් වෙබ් අඩවියට ප්‍රකාශ කල ආකාරයට "ආයාචනය හුදෙක් විධිමත් භාවය සඳහා පමනයි. එය ආයාචනයක් මිස වාදයක් නෙමෙයි."

ආන්ඩුවේ ප්‍රධාන උත්සුකය කොන්ත්‍රාත් ශ්‍රමිකයන් විකිනීමට බාධා පමුනුවා නොගැනීම ය. ශ්‍රී ලංකාවේ ප්‍රධාන විදේශ විනිමය ඉපැයුම්කරුවා බවට පත් කරමින් විදේශ සේවයේ නියුක්ත කම්කරුවෝ පසුගිය වසරේ ඩොලර් බිලියන 2.3 විදේශ විනිමය රටට ගෙන ආහ.

© www.wsws.org